**ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුනි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්වය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 වර්ෂයේ අයවැය යෝජනාවක් වූ ක්ෂේත්‍ර නිලධාරීන් හට යතුරුපැදි ලබාදීමේ වැඩසටහනට අදාළව යතුරුපැදි සඳහා වූ මූලික ගෙවීම, බදු නොවන ආදායමක් ලෙස දෙපාර්තමේන්තුව විසින් 2003.04.00 දරන ආදායම් සංකේතාංකයට ගිණුම්ගත කර තිබූ අතර එසේ ලබා දුන් සියළුම යතුරුපැදි 2020 වර්ෂය අවසාන වන විට අදාළ නිලධාරීන්ගේ පෞද්ගලික අයිතියට පැවරී අවසාන විය යුතුව තිබුණි. එසේ වුවද එම වැඩසටහනට අදාළව මූලික ගෙවීම ලෙස රු.909,850 ක ශුද්ධ ආදායමක් 2022 වර්ෂය තුළදීත් ලැබී තිබුණි. ඒ අනුව අදාළ අයවැය යෝජනාව ක්‍රියාත්මක කර අවසන්ව තිබියදීත්, ඊට අදාළ විධිමත් උපදෙස් ලබා දෙමින් ගිණුම්ගත කිරීම අවසන් කර නොතිබුණි. | මෙම ගැටළුව කඩිනමින් නිරාකරණය සඳහා වෙන වෙනම ආයතන ප්‍රධානීන්/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙතින් පරීක්ෂා කිරීම තව දුරටත් කරගෙන යනු ලැබේ. | 2015 වර්ෂයේ අයවැය යෝජනාවක් වන බැවින්, විධිමත් උපදෙස් හා මඟපෙන්වීම් සිදු කරමින් තවදුරටත් හිඟ ආදායම් පවතී නම් ඒවා රැස්කර ගැනීමට කටයුතු කිරීම. |

### 2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වැය විෂයන් 6 ක් හා මූලධන වැය විෂයයන් 3 ක් වෙනුවෙන් අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් එම ප්‍රතිපාදන උපයෝජනය කළ පසු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක සිට සියයට 70 ක් අතර පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. | රටේ පැවතුන අයහපත් හා අනපේක්ෂිත ආර්ථික තත්වය තුල රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා දැඩි වියදම් පාලනය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද චක්‍රලේඛ අංක 03/2022 ට අනුගතව, සැලසුම් කළ කාර්යයන් ප්‍රමුඛතා ගතකිරීම/ ඇතැම් වියදම් කල් දැමීම, මූල්‍ය කල් බදු ක්‍රමය යටතේ මිලදීගත් වාහන සඳහා ගෙවීම් කලයුතු දිනය වෙනස් වීම හේතුවෙන් කල්බදු වාරික හා පොළිය ගෙවීම සඳහා අපේක්ෂිත පරිදි ප්‍රතිපාදන උපයෝජනය නොවීම, අයවැය සකස් කරන අවස්ථාවේ දේපල ණය ලබාගත් නිලධාරීන් පසුව ස්ථානමාරුවීම, මුලින් මිලදී ගැනීම සැලසුම් කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර තිබුනද මිලදී ගැනීම අත්හිටුවා අක්මුදල් | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වැය විෂයයන් සඳහා තාත්ත්වික ලෙස වියදම් ඇස්තමේන්තු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| | ලබා ගැනීමේද අපහසුව මත වියදම් දැඩිව පාලනය කිරීමට අභ්‍යන්තරව උපදෙස් ලබාදීම හේතුවෙන් මෙලෙස ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | |

### 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2015 සැප්තැම්බර් 23 දින සිට සේවය අතහැර ගිය නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු 150,119 ක ණය ශේෂය 2022 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් වී නොතිබුණි. | ආර්ථික තත්වය අතින් පහල මට්ටමක සිටින බව වාර්තා කර ඇති අතර, මෙම අය සමග අවස්ථා කීපයකදී සාකච්ඡා කිරීම හේතුවෙන් ණය මුදල වාරික වශයෙන් ගෙවීමට එකඟ වී ඇත. ඒ අනුව රු.5000 බැගින් වූ වාරික 03 ක් අයකර ගැනීමට කටයුතු කර ඇත. | අවශ්‍ය සියළු පියවර ගෙන හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම. |

### 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2022 රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 ඡේදය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ද ඉදිරිපත් කළ යුතු වුවද, ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ වාර්ෂික කාර්යසාධන වාර්තාව 2023 පෙබරවාරි 28 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. | මේ වන විට වාර්ෂික කාර්ය සාධන වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර ඇත. | චක්‍රලේඛ විධිවිධානයන්ට අනුකූලව කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2021 අංක 30 දරන විසර්ජන පනතේ තෙවන උපලේඛනය යටතේ වන අත්තිකාරම් කාර්යයන් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කළ පහත විස්තර සඳහන් සීමාවන් භාණ්ඩාගාර පොත් අනුව පිළිපැද නොතිබුණු අවස්ථා අනාවරණය විය. පනතේ 8(1)(ආ) වගන්තිය ප්‍රකාරව 2023 මැයි 31 දින වනවිට පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර එම සීමාවන් සංශෝධනය කර ගත යුතුව තිබුණත්, 2022 මැයි 19 දින වන විටත් එම සිමාවන් සංශෝධනය කර ගත් බව තහවුරු කිරීමේ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (i) රජයේ නිලධාරින්ට අත්තිකාරම් කාර්යයන් 02 කට අදාළ උපරිම වියදම් සිමාව එකතුව රු.602,888 කින් ඉක්මවා වියදම් කර තිබුණි. | මෙම ආයතන විසින් සීමා සංශෝධනය කිරීමට ඉල්ලීම් ඉදිරිපත් කර නොතිබුණි. අවසන් භාණ්ඩාගාර මුද්‍රිත සටහන්වල විෂය අංක 25301 හා 32201 හි වියදමේ මෙම සීමා ඉක්මවීම් වාර්තා වි ඇත්තේ වැරදි නිවැරදි කිරීම් මත බවත් ඒ සඳහා සීමා සංශෝධනයන් අවශ්‍ය නොවන බවත් දැනුම් දී ඇත. | විසර්ජන පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර, සීමා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |
| (ii) විෂය අංක 31002 - රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ කළ වැඩ අත්තිකාරම් ගිණුමේ උපරිම වියදම් සිමාව රු.76,900,472 කින් ඉක්මවා රු.196,900,472 ක් වැය කර තිබුණි. | අදාල සීමා සංශෝධනය සඳහා වූ යෝජනාව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට 2023.04.24 දි අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබේ. ඒ අනුව, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගේ අත්සනින් යුතුව එම යෝජනාව 2023.05.25 දින පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමට ඉදිරිපත් කර ඇත. | විසර්ජන පනතේ සඳහන් විධිවිධාන ප්‍රකාරව කටයුතු කර, සීමා සංශෝධනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කරනු ලබන ආයතන 117 ට අදාල ක්‍රියාකාරී සැලැස්මේ හෝ ක්‍රියාකාරකම්හි 2022 දෙසැම්බර් 31 දිනට කාර්යසාධනයට අදාල තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | රටේ පැවති වාතාවරණය හමුවේ රාජ්‍ය ව්‍යාපාරවල නිලධාරීන් ගෙන්වා ආයතනවල ප්‍රගතියේ අධීක්ෂණ කටයුතු සිදු කිරීම සීමිත වුවත් මාර්ගගත ක්‍රමය ඔස්සේ හා හැකි සෑම අවස්ථාවකදීම නිලධාරීන් ගෙන්වා ගනිමින් සැලකිය යුතු ආයතන ප්‍රමාණයක කාර්ය සාධනය අධීක්ෂණය සිදු කරන ලදි. මෙම ආයතනවල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදී ඇති මග පෙන්වීම් අනුව එම ආයතනවල රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කිරීමටත් එමෙන්ම භාණ්ඩාගාර නියෝජිතයින් දැනුවත් කිරීමටත් කටයුතු කෙරිණි. | දෙපාර්තමේන්තුවේ විෂය පථයට ගැනෙන ආයතනවල අධීක්ෂණ කටයුතු විධිමත්ව සිදු කළ යුතු වීම. |

**3.2 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගි වී රැකියා අහිමිවූවන්ට සහන සැලසීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1980 ජූලි වැඩ වර්ජනයට සහභාගී වී රැකියා අහිමිවූ ස්ථිර ජීවනෝපාය මාර්ගයක් නොමැති වූ වයස අවුරුදු 65 සම්පූර්ණ වූ පුද්ගලයන්ට සහන සැලසීම සඳහා දීමනාවක් ලබාදීමට අයවැය යෝජනා මගින් 2013 වර්ෂයේ සිට අනුමත වී තිබුණි. ඒ අනුව 2013 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් 31 දක්වා මසකට රු.5,000 බැගින් ද, 2015 ජනවාරි 01 දින සිට 2015 දෙසැම්බර් 31 දක්වා මසකට රු.6,000 බැගින් ද, 2015 දෙසැම්බර් 31 දිනෙන් පසුව එක්වරක් පමණක් ගෙවනු ලබන රු.250,000 ක දීමනාවක් ද ලබා දීමට අයවැය යෝජනා ක්‍රියාත්මක වී තිබුණි. නමුත් දෙපාර්තමේන්තුව මේ සඳහා හිමිකම් ලබන්නන් නිශ්චිත වශයෙන් හඳුනා ගැනීමක් සිදුකර නොතිබුණි. මෙම තත්ත්වය දිගින් දිගටම විගණනය විසින් පෙන්වා තිබුණ ද ඒ සම්බන්ධව මේ දක්වා පැහැදිලි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. කෙසේ වෙතත්, 2022 වර්ෂය තුළදී ප්‍රතිලාභීන් 69 දෙනෙකු සඳහා එක්වරක් පමණක් ගෙවනු ලබන දීමනාව වූ රු.250,000 බැගින් රු.17,250,000 වටිනාකමින් යුතු මුදලක් ගෙවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර තිබුණි. | 2013 වර්ෂය සඳහා වූ මෙම අයවැය යෝජනාවට පදනම් කරගෙන ඇත්තේ එවකට මුදල් අමාත්‍යාංශය හා කම්කරු අමාත්‍යාංශය, වෘත්තීය සමිති සමඟ එවකට පැවති සාකච්ඡාවලදී අනාවරණය වූ තොරතුරු වන අතර, ඒ අනුව 1980 ජූලි වැඩ වර්ජනයෙන් රැකියා අහිමි වී ස්ථිර ජීවනෝපායක් නොමැති වූවන් 10,000 ක පමණ පිරිසක් සිටින බවට වාර්තා වී ඇත. මෙම වැඩසටහන යටතේ ගෙවීම් සිදු කිරීමේදී 1980 ජූලි වර්ජනයට සහභාගී වී රැකියා අහිමි වූවන්ගේ ඉල්ලීම්, ප්‍රාදේශීය ලේකම් විසින් ලබාදෙන නිර්දේශ පදනම් කර ගනිමින් එවකට මෙම සේවකයින් සේවා කරන ලද විෂය භාර අමාත්‍යාංශ වන කම්කරු, ප්‍රවාහන, කර්මාන්ත, හා නිවාස යන අමාත්‍යාංශවල නිර්දේශ අනුව සිදු කිරීම සාමාන්‍ය ක්‍රමවේදය වේ. | අයවැය යෝජනාවලින් අපේක්ෂිත අරමුණු ළඟා කර ගැනීමට අදාළව විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

## 3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

(අ) 2021 ජූලි 28 දින මුදල් අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර තිබූ සංදේශයට 2021 අගෝස්තු 18 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර, ඒ අනුව ගිලන් රථ 50 ක්, වතුර බවුසර් 52 ක් හා ඩබල් කැබ් රථ 62 ක් මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ 2021 වර්ෂයේදී මිලදී ගෙන තිබුණි. ඒ අනුව 2021 වර්ෂය අවසානය වන විට මෙම වාහන 164 ආනයනය කර තිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනවන විට ඉන් වාහන 76ක් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ අතර වාහන 51ක් වාහන අවශ්‍ය කරන ආයතන වෙත භාර දී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| වාහන වර්ගය | 2021 වර්ෂය තුල | | 2022 වර්ෂය තුල | |
|---|---|---|---|---|
| | ලියාපදිංචිය සම්පූර්ණ කළ වාහන සංඛ්‍යාව | ආයතන වෙත පවරා දුන් කාලපරිච්ඡේදය | ලියාපදිංචිය සම්පූර්ණ කළ වාහන සංඛ්‍යාව | ආයතන වෙත පවරා දුන් කාලපරිච්ඡේදය |
| ගිලන් රථ | 25 | 00 | 25 | 50 |
| කැබ් රථ | 51 | 51 | 11 | 11 |
| වතුර බවුසර් | 00 | 00 | 52 | 52 |
| එකතුව | 76 | 51 | 88 | 113 |

තවද යථාරූපී සංකල්පය අනුව ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තා කිරීමේදී නීතිමය අයිතිය කුමක් වුවත්, වත්කම ආර්ථික ප්‍රතිලාභ අත්කර දෙන්නේ නම් එහි ප්‍රායෝගික යතාර්ථය පදනම් කර ගත යුතු අතර අනාවරණ සංකල්පය අනුව මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේදී අදාළ කාලපරිච්ඡේදයට අයත් සියලු

මෙම මිලදී ගත් වාහන 164 න් වාහන 76 ක් 2021 වර්ෂයේදී ද, වාහන 88 ක් 2022 වර්ෂයේදී ද, ලියාපදිංචි කර ඇති අතර 2021 වර්ෂයේදී වාහන 51 අදාල ආයතන වෙත භාරදී ඇති අතර, 2022 වර්ෂයේදී වාහන 113 අදාල ආයතන වෙත භාරදී ඇත. එමෙන්ම ගිවිසුම් වලට අනුව ගෙවීම් කටයුතුද 2022 වර්ෂයේදී ආරම්භ කර ඇත. එම තත්ත්වය සැලකිල්ලට ගෙන එම වාහන 2022 වර්ෂයේදී ගිණුම්ගත කිරීම සිදුකර ඇතත් 2021 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන වලින් ඉදිරිපත් කළ තොරතුරුවලට මෙයින් ප්‍රමාණාත්මක බලපෑමක් සිදුව නොමැති බැවිනි.

යථාරූපී සංකල්පයට සහ අනාවරණ සංකල්පයට අනුව වත්කම් ගිණුම්ගත කළ යුතු වීම.

| | | | |
|---|---|---|---|
| | තොරතුරු, මූල්‍ය වාර්තා පරිහරණය කරන පාර්ශවයන්ට අනාවරණය කළ යුතුය. එසේවෙතත් මෙම වාහන 164හි එකතු වටිනාකම රු.1,693,839,615 ක් 2022 වර්ෂයේ මූල්‍ය කල්බදු යටතේ මිලදී ගෙන තිබූ වත්කම් ලෙස සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම් ගත කර තිබුණි. | | |
| (ආ) | දෙපාර්තමේන්තුව විසින් වාහන අවශ්‍ය කරන ආයතන වෙත එම වාහන පවරා දීමට කටයුතු කර ඇති බව දන්වා තිබුනද ආයතන 15 ක් විසින් එම වාහන භාරගත් බවට ලිඛිත සාක්ෂියක් හෝ විගණනය වෙත ඉදිරිපත් නොවිනි. | වාහන භාරගත් බොහෝ ආයතන විසින් වාහන භාරගත් අවස්ථාවේදී සහ ආයතන කිහිපයත් ඊට පසුව වාහන භාරගත් බවට ලිඛිතව දන්වා ඇත. | වත්කම් පවරා දීමේදී විධිමත් පාලන ක්‍රමවේදයක් හඳුන්වා දිය යුතු වීම. |

## 3.4 පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය තුළ වෙනත් වියදම් ශීර්ෂ වෙත ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ පුනරාවර්තන වියදම්වලට අදාළව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ඇතුළත්ව ආයතන 81 කට අදාළව නිකුත් කර තිබූ ප්‍රතිපාදනයන්ගෙන් එකතුව රු.23,424,731,937 ක් වුවත්, ACA-2(ඒ)(ii) ආකෘතියෙහි එම වටිනාකම රු.23,092,547,937 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, ලබා දුන් ප්‍රතිපාදනයේ රු.332,184,000 ක නොසැසඳීමක් විය. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ වූ නිකුත් කරන ප්‍රතිපාදන නිසි පරිදි ACA ආකෘතිවල සටහන් කර ඇති බව තහවුරු කර ගත යුතු වීම. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් ACA-2(ඒ)(ii) හා ACA-2(ඒ)(iv) ආකෘතීන් අනුව ආයතන වෙත පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ ලබා දුන් පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදනයේ වටිනාකම් පරිපූරක ඇස්තමේන්තුව සමඟ සැසඳීමේදී ප්‍රතිපාදනයන් ලබා දී තිබූ ආයතනයන්හි වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන ගිණුම්ගත කිරීමේදී නිරවද්‍යතාවය තහවුරු කරගත යුතු වීම. |

| ACA-2(ඒ)(ii) ආකෘතිය අනුව ප්‍රතිපාදන ලබා දුන් ආයතනය | පරිපූරක ඇස්තමේන්තු අනුව ප්‍රතිපාදන ලබා දුන් ආයතනය | ලබා දී තිබූ ප්‍රතිපාදන මුදල (රු.) | බල අංකය |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | | |
| • වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 55,000,000 | 155 |
| • වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 314,312 | 175 |
| **මූලධන වියදම්** | | | |
| • ශ්‍රී ලංකා නාවික හමුදාව | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | 486,000,000 | 260 |

| | | |
|---|---|---|
| (ඇ) පරිපූරක ඇස්තමේන්තු බල අංකය 123 යටතේ පුනරාවර්තන ප්‍රතිපාදන රු.3,000,000 ක් හා මූලධන ප්‍රතිපාදන රු.5,000,000 ක් ලෙස වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණි. නමුත්, මූල්‍ය ප්‍රකාශන තුළ ACA-2(ඒ)(ii) හා ACA-2(ඒ) (iv) ආකෘතීන් අතර පුනරාවර්තන ප්‍රතිපාදනය රු.5,000,000 ක් ලෙසත් මූලධන ප්‍රතිපාදනය රු.3,000,000 ක් ලෙසත් සඳහන් කර තිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. | පරිපූරක සහය සේවා සහ හදිසි අවශ්‍යතා වගකීම් වැය විෂයය යටතේ පුනරාවර්තන හා මූලධන ප්‍රතිපාදන ගිණුම්ගත කිරීමේදී නිරවද්‍යතාවය තහවුරු කරගත යුතු වීම. |

## 3.5 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශයෙහි (ඇමුණුම ii) හි සඳහන් වර්ෂය තුළ මු.රෙ. 109 යටතේ වන පොතෙන් කපාහැරීම් හා අය කර ගැනීම් යටතේ 2022 වර්ෂය තුළ පහත අවස්ථා 3 කදී සිදු වී තිබූ හානි හා එක් අවස්ථාවකට අදාලව වූ අයකර ගැනීම් පිළිබඳ පහත සඳහන් තොරතුරු ඇතුළත් කර නොතිබුණි. | වාහන අනතුරු වලින් සිදුවූ සියළු හානි රක්ෂණය මගින් පූර්ණ වශයෙන් ආවරණය කර ඇති බැවින් මු.රෙ 109 යටතේ පොතෙන් කපා හැරීම් 2022 වර්ෂයට අදාලව වාර්තා වී නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වීම. |

| දිනය | විස්තරය | අලුත්වැඩියා වියදම | අයකර ගත් වටිනාකම | අයකර ගත් දිනය |
|---|---|---|---|---|
| ----------- | --------- | ------- | -------- | ---------- |
| | | රු. | රු | |
| 2022.05.10 | NC-5410 වෑන් රථයට සිදුවූ අනතුර | 42,000 | 42,000 | 2022.06.24 |
| 2022.07.01 | NC-5410 වෑන් රථයට සිදුවූ අනතුර | 19,000 | 19,000 | 2023.01.26 |
| 2022.11.14 | NB-3230 වෑන් රථයට සිදුවූ අනතුර | 39,700 | 39,700 | 2023.01.12 |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත හා තත්‍ය කාර්ය මණ්ඩල තොරතුරු අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක් ද, ද්විතියික මට්ටමේ තනතුරු 09 ක් ද, ප්‍රාථමික මට්ටමේ තනතුරු 06 ක් ද ලෙස එකතුව පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 23 ක් පැවතුණි. | දැඩි වියදම් පාලනය හා බඳවාගැනීම්/ පුරප්පාඩු පිරවීම අත්හිටුවීම සම්බන්ධයෙන් නිකුත්කරන ලද විවිධ උපදෙස්ද මෙම තත්වයට හේතු වී ඇත. | පුරප්පාඩු පියවීම හෝ කාර්ය මණ්ඩල සංශෝධනය කළ යුතු වීම. |